# වාස්තුවිද්‍යානුකූල බහිරව සංකල්පයේ බලපෑම පිළිබඳ විමර්ශනයක්

එච්.ඩබ්. නිපුන තත්සර[1], ඒ.පී. සඳරුවන්[2]

බහිරව සංකල්පය පිළිබඳ අවධානය යොමු කිරීමේදී ගෘහයක ප්‍රධාන ශාන්තිකර්මයක් ලෙස මෙය හඳුන්වාදිය හැකිය. බහිරවයා යනු අදෘශ්‍යමානව ආරක්ෂා කරන්නායි. ආපෝ, තේජෝ, වායෝ, පඨවි, ආකාශ යන පංච මහා භූතයන් ලොව වන අතර වායෝ භූතයාගෙන් වාතය ද පඨවි භූතයා වන මහ පොළොවෙන් ආහාර පද්ධතිය සකස් කිරීම ද කෙරෙන නමුත් පඨවි ධාතුව තුළ අරක්ගත් (භෛරව) භහිරව දේවතාවුන් ඒවා ආරක්ෂා කරන්නේ එක්තරා දිනයක වූ පොරොන්දුවක් ඉටු කිරීමක් වශයෙනි. මෙම ලෝකයේ සෑම බිම් අඟලකම මෘත දේහයක් මිහිදන් වී ඇත. එසේ නොමැති ස්ථානයක් දක්නට නොමැති බව බුදු දහමේ අන්තර්ගත වෙයි. ඒ අනුව එම මියගිය ප්‍රාණ කාරයින් එම මියගිය භූමියට අරක්ගෙන සිටින බව සමහර මිනිසුන් පිළිගනු ලැබේ. එසේ හෙයින් ගෘහයක් තැනීමේ දී යම්කිසි ගොඩනැගිල්ලක් තැනීමේ දී ප්‍රථමයෙන් බහිරව පූජාවක් දී එම බහිරවයාගෙන් එම භූමිය නිදහස් කරගැනීම සාමාන්‍ය සිරිත වේ. මෙම සාර සංක්ෂේපයෙහි පර්යේෂණ අරමුණ වන්නේ වාස්තුවිද්‍යානුකූල බහිරව සංකල්පයේ බලපෑම වර්තමානයට කෙසේ බලපාන්නේ ද යන්න පිළිබඳව සොයා බැලීමයි. වාස්තුවිද්‍යාව යන මාතෘකාව ගත්කළ බොහෝ වපසරියක් දක්නට ඇතිමුත් මෙහි පර්යේෂණ සීමාව ලෙස යොදා ගනු ලබන්නේ බහිරව සංකල්පය පිළිබඳවය. බහිරව සංකල්පය වාස්තුවිද්‍යාත්මකව ගුප්ත ශාස්ත්‍රය සබන්ධව ඥාතීත්වයක් දක්නට ලැබෙන අතර අතීතයේ මෙම පිළිගැනීම වලංගු වුව ද වර්තමානයේ පවත්නා වූ සීමිත ඉඩ ප්‍රස්ථාව යටතේ ගොඩනැගිලි සඳහා මෙය බලපානවා ද යන්න මෙහි පර්යේෂණ ගැටළුව වේ. වත්මන් ආර්ථික සංවර්ධනය හමුවේ බහිරව පූජා සංකල්පය ග්‍රාම්‍ය සංකල්පයක් බවට පත්ව ඇත. නාගරීකරණය තුළ හුදෙක් ගෘහ තැනීමේ දී මෙම සංකල්පය පිළිබඳව අවධානය යොමු කරන බවක් දක්නට නොහැකිය. මෙම සාර සංක්ෂේපයේ පර්යේෂණ ක්‍රමවේදය ලෙස පුස්තකාලය තුළ ප්‍රාථමික සහ ද්විතීයික දත්ත පරිශීලනය කිරීම මගින් දත්ත රැස්කර ගන්නා ලදී. අධ්‍යයනයේ දී පැහැදිලි වුයේ බහිරව වර්ග අටක් පිළිබඳව සාහිත්‍යයේ සඳහන් වන බවය. බහිරව පූජාවේ දී සූනියම් දෙවියන්ට හා ඊශ්වර දෙවියන්ට විශේෂ ස්ථානයක් හිමි වේ. ඊශ්වර දෙවි මෙම බහිරව පූජාවට අධිගෘහිත දෙවි වන්නේය. රාත්‍රී දොළහෙන් පසුව මන්ත්‍ර ජපකර යක්ෂයන්ට ප්‍රේතයන්ට ආමන්ත්‍රණය කරනු ලබන්නේ නිවසේ අය එළියට යෑම වැළැක්වීමටය. මේ කරුණු අනුව බොහෝ දෙනාගේ මතය වන්නේ බහිරව පූජාව අනිවාර්ය බවයි. වර්තමාන සමාජ ක්‍රමවේදය යටතේ ගෘහය මෙන්න ගොඩනැගිලි නිර්මාණයේදී බහිරව දෝෂය බලපාන බව අර්බුදකාරී වී ඇත.

ප්‍රමුඛ පද : බහිරව සංකල්පය, වාස්තුවිද්‍යාව, නාගරීකරණය, ගෘහ නිර්මානය, ශාන්තිකර්මය

[1 2] සිංහල අධ්‍යයනාංශය රුහුණ විශ්වවිද්‍යාලය. nipunwithanage4470@gmail.com